A/L පන්තිය
www.alpanthiya.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ட்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | | |
|---|---|---|---|
| සිංහල I<br>சிங்களம் I<br>Sinhala I | 71 S I | | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස්:**

* **පළමුවැනි** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.

● පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. (අ) පෙරාතු දවසක දී සිටාණෝ රජගෙට ගොසින් එන තෙනැත්තෝ එක් සාකුස් ඇති දනවු මිනිසකු කුම්මාසයන් පිරුණු කබලුපූවක් කන්නවුන් දැක සම්පත් මහත් වූවත් අදහස කුඩා හෙයින් ඒ කබලුපූවෙහි රුචියක් ඇතිව ගෙන තමන්ගේ ගෙට ගොසින් 'ඉදින් කබලුපූවක් කනු කැමැත්තෙමී කීම් නම් මා කැමති වූවා සේ ම බොහෝ දෙනත් කන්ට සිතා ගනිති. එසේ කලට මාගෙන් බොහෝ සාල් හා කිරි පැණි සකුරු ආදී වූ බොහෝ දෙයට අළවි පෙනෙයි. කිසි කෙනකුන්ටත් නොකියම්'යි සම්පත් ඇති තියාව කාටත් නොහඟවන්නා සේ ම කබලුපූවට කළ ආලයත් සිටුදුවණියන් පමණකටත් නොහඟවති. නොහැඟවීමෙන් කල් යත් යත් කසායුස වත් කොට පිසූ කබලුපූ සේ පඬුවන් පැහැ ඇති විය. නොතර මාලුකඩෙක වැල් පැදලූ කලක් මෙන් ඇඟ නහරවැලුත් ඉපිළ ගියේ ය.

   (i) සිටාණන්ට කබලුපූවෙහි රුචියක් ඇති වූයේ ඇයි?

   (ii) සිටුතුමා කබලුපූවක් කනු කැමති බව කාහටවත් නො පැවසූයේ ඇයි?

   (iii) කල්යාමේ දී සිටාණන්ගේ සිරුර කිනම් පැහැයක් ගත්තේ දැයි පහදා දෙන්න.

   (iv) **"නොතර මාලුකඩෙක වැල් පැදලූ කලක් මෙන්"** යන්නෙහි අර්ථය පහදන්න. (ලකුණු 04 යි.)

   (ආ) බෝධිසත්වයෝ ඒ චන්ද්‍ර කුමාරයනුත් කල් යවා නොඑන හෙයින් "එක්තරා අන්තරායෙක් විය යුතු ය'යි තුමූ එතනට ගොස් දෙදෙනා ම විලට බට පියවර සටහන් දැක "මේ විල රාක්ෂසයකු අධිගෘහිත විලක් වුව මැනවැ"යි සිතා කඩුව උරයේ එල්වා ගෙන දුන්න නගා දුනු මිට හීය ලා ගෙන සිටියාහු ය. දිය රකුසු බෝධිසත්වයන් දියට නොබස්නා දැක වල දඬු කපා ඇවිදිනා පුරුෂයකු මෙන් තමාගේ ස්වරූපය පාලා බෝධිසත්වයන්ට කියන්නේ "පින්වත් වූ පුරුෂය, තොපි මග ගමන් යාමෙන් මිරිකී ගියව, කුමක් හෙයින් මේ විලට බැස නා පියා පැන් බී නෙළුඹල හා නෙළුඹුදැලි කා මල් පැළඳ සැප සේ නො යවු දැ"යි කිවූ ය.

   (i) බෝධිසත්වයන් තම සොහොයුරන්ට වූ අනතුර දැනගත්තේ කෙසේ ද?

   (ii) දියට නොබසින බෝධිසත්වයන් ඉදිරියෙහි දිය රකුසා කිනම් ස්වරූපයකින් පෙනී සිටියේ ද?

   (iii) බෝධිසත්වයෝ විල අසල කිනම් ආකාරයකින් සිටියාහු ද? යන්න විස්තර කරන්න.

   (iv) **'කල් යවා නොඑන හෙයින්'** හා **'මග ගමන් යාමෙන් මිරිකී ගියව'** යන පාඨවල අර්ථ ලියන්න. (ලකුණු 04 යි.)

   (ඉ) එතැන් පටන් කම්මාරතිස්සයෝ දානාදී වූ පින්කම් කෙරෙමිනි ආයු කෙළවර එයින් මිය අනුරාධපුර නුවර දුටුගැමුණු රජ්ජුරුවන්ට පුත් ව උපන්හ. ඔවුන් මව්කුසින් බිහිවීම හා සමග සියලු ලංකාද්වීපයෙහි එකපැහැර සුවඳ රත්හැල් වර්ෂ කළේ ය. යටත් පිරිසෙයින් උදුනෙහි තබන ලද තණසාල් ආදී බතුදු පෙරළී සුවඳ හැල්සාලේ බත් ම විය. තණ වරා ආදී වූ කටුසර පිරූ කොටුගුලු සුවඳ හැලින් පිරිණ. වී නැති සිස් කොටුගුලු ද එපරිද්දෙන් ම හැලින් පිරුණේ ය. උදක් ඔවුන් උපන් දවස මතු නොවෙයි. ඒ කුමාරයන්ට තුන්මසින් සත්මසින් නවමසින් කළ මනා ඒ ඒ මඟුල් දිනයෙහි ද බත් කැවීම්, කන්විදීම්, යුවරජ තැන් ලැබීම් ආදී වූ ඒ ඒ මඟුල් දිනයෙහි ද මුළු ලක්දිව එක පැහැර ඇල් වැසි වැස පිරී ගිය, තණ වරා ආදී වූ ශස්‍යජාතීහු ද පෙරළී ශාලි ජාති ම වූහ. මෙසේ ඒ රාජකුමාරයන් නොයෙක් ආශ්චර්ය ලොව පහළ කෙරෙමින් ශාලිබන්ධු ව උපන් හෙයින් ඔවුන්ට ශාලි කුමාර ය යි නම් තුබූහ.

   (i) කම්මාරතිස්සට තමන් විසින් කරන ලද පුණ්‍යකර්මවල විපාක ලැබුණේ කෙසේ ද?

   (ii) ඔහු මව්කුසින් බිහිවීමත් සමග සිදු වූ ආශ්චර්ය කුමක් ද?

   (iii) රාජ කුමාරයා ශාලි කුමාර යැයි ප්‍රසිද්ධ වූයේ කවර හෙයින් ද?

   (iv) **'කටුසර'** හා **'කොටුගුලු'** යන වචනවල අරුත් පහදන්න. (ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

www.alpanthiya.lk

(ඊ) මහත සසර සයුරෙහි කුමුටුව සරන
අනත සත නිවන් පුර ගෙන යන සිතින
සතත සොඳුරු බුදුකුරු ගුණ දම් පූරන
දියත පසිඳු නතිඳුන් දැක ගොස් සොබන

පව ර රුසිරු මහ සෑ සමග බෝ තුරු
නොහැ ර නැමැද බැති පෙම් සිතිනි විසිතුරු
වෙහෙ ර පුද පසඟ තුරු රැව් නොදෙන තුරු
මිතු ර තොසින් වැද සැදි සොඳුරු පහතුරු

(i) නාථ දෙවිඳු බුදුකුරු ගුණදම් පුරන්නේ කුමක් සඳහා ද?
(ii) 'සසර සයුරෙහි' යන්නෙහි කාව්‍යාලංකාරය නම් කරන්න.
(iii) ගිරවාට මහසෑය සහ බෝරුක නමදින්නට කීවේ කවර ආකාරයට ද?
(iv) '**පුද පසඟ තුරු රැව්**' යන්නෙහි අර්ථය ලියන්න. (ලකුණු 04 යි.)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.
(i) "නුවණැත්තවුන් විසින් ශීලවිශුද්ධිය කොට ගෙන තමතමන්ට පිහිට විය යුතු ය."
(ii) "සියලු වැව් පොකුණු හෝ කඳුරැලි ආදිය ප්‍රසන්න ජලයෙන් පිරී සිටිනේ ය."
(iii) "එසේ හෙයින් නැවත ගිහිගෙය විසිය නො හෙමි."
(iv) "ඕක පරෙස්සමෙන් තියාගන්න. හරි වටින දෙයක්."
(v) "යකෙක්, යකෙක්, මේ මූණමල් ගහේ යකෙක් ඉන්නවා."
(vi) "හාමු මං ගිහින් එන්නම්. හාල් තුනපහ ගන්ඩ කඩේ යන්ඩත් තියෙනවා" (ලකුණු 08 යි.)

(ඌ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

අට වයස් නොදරුවා
හැට පිරුනු කලු සමින්
වැසුනු ඇටසැකිල්ලකි

එහෙත් ඔහු සිනා සෙයි
දත් පුරා සිනාසෙයි
කට පුරා සිනාසෙයි

ඇට පෙනෙන මුහුන මත
දෙකන තෙක් දිග් ගැහුනු
සිනාවෙන් ඔහු මුහුන
පුරුදු නැති සිත්තරෙකු
නොාංචි කෝලමට කැපූ
සරිය වෙස් මූහුනකට

වමත පොල් කටුවෙ සිට
කට ලඟට ගොස් වැටෙන
ලී කැබැල්ලකි සුරත

බට්ටෙක් මෙන් ඔරලෝසුවෙ
ගනන් බලා තුන් විඩයක්
උඩහට පහලට ගිය අත
හිස් පොල් කටුවේ
එකවර නැවතින

"පොඩි ළමයෝ
බත්
ඉවර ද කාලා"

A/L පන්තිය
www.alpanthiya.lk

පුදුමයෙන් මෙන් බලා මා දෙස
දෙකන තෙක් දික් සිනා පාලා
වීසිකොට පොල් කටුව කානුවේ
පිස දමයි අත ඉරුනු සරමේ (ලකුණු 16 යි.)

2. "කථාවස්තු ප්‍රබන්ධයේ දී සද්ධර්මරත්නාවලී කතුවරයා ධර්ම දේශනා ශෛලිය, උසස් ගද්‍ය රීතියකට සරිලන පරිදි සකසා ගත්තේ ය." නියමිත කථා වස්තු ඇසුරෙන් මේ අදහස විමසන්න. (ලකුණු 15 යි.)

**නැතහොත්**

ලේඛකයාගේ විවරණයට හසුවන කථාවස්තුවල චරිත විග්‍රහය සදාතනික අගයකින් යුක්ත වන ආකාරය නියමිත ජාතක කතා **දෙකක්** ඇසුරෙන් පහදන්න. (ලකුණු 15 යි.)

3. "සමාජයක මුල් බැස ඇති ආචීර්ණකල්පිත ආකල්ප කෙරෙහි සද්ධර්මාලංකාර කතුවරයාගේ දෘෂ්ටිය කිනම් ස්වරූපයකින් යුක්ත වී දැයි" නියමිත කථාවස්තු ආශ්‍රයෙන් විමර්ශනයක යෙදෙන්න. (ලකුණු 15 යි.)

4. වර්ණනාවල විවිධත්වයට අනුරූප වන ලෙසට උචිත කාව්‍යෝක්ති නිර්මාණයෙහි ලා ගිරා සන්දේශ කතුවරයා, දක්වන සාමර්ථ්‍යය වර්ණනා **තුනක් වත්** ආශ්‍රය කොට ගෙන සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

5. "සාර්ථක චරිත හා සිද්ධි නිරූපණය උදෙසා ජපානයේ පරිසරය හා සමාජ සංස්කෘතික පසුබිම කතුවරයාට ඉවහල් විය." 'මළ ගිය ඇත්තෝ' නවකතාව ඇසුරෙන් විභාග කරන්න. (ලකුණු 15 යි.)

6. කුටුම්බ ජීවිතයෙහි සංකීර්ණ ස්වභාවය ප්‍රතිනිර්මාණයෙහි ලා නූතන කෙටිකතාකරුවන් උත්සුක වී ඇති ආකාරය නියමිත කෙටිකතා **තුනක් වත්** ආශ්‍රය කොට ගෙන සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

7. පුද්ගල හා සමාජ අත්දැකීම් නිරූපණයෙහි ලා නූතන කවීන් ප්‍රකට කළ මානව හිතවාදී දෘෂ්ටිය නියමිත පද්‍ය පන්ති **තුනක් වත්** නිදසුන් කොට දක්වමින් පහදන්න. (ලකුණු 15 යි.)

8. නාට්‍යෝචිත අවස්ථා ගොඩනගමින් නාට්‍ය විකාශනයෙහි ලා උදයන රජුගේ චරිතය ඉවහල් වී ඇති ආකාරය රත්නාවලී නාට්‍ය පෙළ ඇසුරෙන් උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் **இலங்கைப் பரீட்சைத் திணைக்களம்** இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka **Department of Examinations, Sri Lanka** Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | | |
|---|---|---|---|
| සිංහල II<br>சிங்களம் II<br>Sinhala II | 71 S II | | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>*Three hours* |

විභාග අංකය : ..........................

උපදෙස්:

* **I** කොටසේ **1** ප්‍රශ්නය ද, **II** කොටසේ **2, 3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* **1** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මෙම **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. **'සන්ධ්‍යක්ෂර'** අන්තර්ගත වරණය තෝරන්න.
(1) අ, ඉ, උ, ඍ (2) ආ, ඊ, ඌ, ඒ, ඕ (3) ඛ, ඡ, ඣ, ඣ (4) ඒ, ඓ, ඕ, ඖ (5) ය, ර, ල, ව (......)

1.2. **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.
(1) අරුණළු, කළණ, කාළගෝල, දැකුම්කලු, පිළිසරණ
(2) අරුණළු, කලණ, කාලගෝළ, දැකුම්කළු, පිළිසරණ
(3) අරුණලු, කලණ, කාළගෝළ, දැකුම්කලු, පිළිසරණ
(4) අරුණලු, කළණ, කාලගෝල, දැකුම්කළු, පිළිසරන
(5) අරුනළු, කලන, කාළගෝල, දැකුම්කලු, පිලිසරන (......)

1.3. **අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති** පද පේළිය තෝරන්න.
(1) ගුරුළුගෝමී, වැත්තෑවේ, විද්‍යාචක්‍රවර්ති, ධර්මසේන
(2) බුද්ධපුත්‍ර, පැරකුම්බා, පරාක්‍රම පණ්ඩිත, අලගියවන්න
(3) මෛත්‍රේය, රාහුල, මිහිරිපැන්නේ, ගජමන් නෝනා
(4) සරණංකර, පත්තායමේ ලේකම්, ධම්මානන්ද, කවීශ්වර
(5) අනවමදර්ශි, කුමාරදාස, ධර්මාරාම, වෛදේහ (......)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **නිරවද්‍ය ප්‍රකාශය** තෝරන්න.
(1) 'යංශය' යනු 'ය' යන්න වෙනුවට යෙදෙන අක්ෂර සංකේතයකි.
(2) 'යංශය' 'ර' කාරයෙන් පරව ද යෙදේ.
(3) 'යංශය'ට පෙර යෙදෙන ව්‍යඤ්ජනය හල් සලකුණ සහිත ව යෙදේ.
(4) අන්‍ය ව්‍යඤ්ජනවලට මෙන් හුදකලා යංශයට ද සියලු පිල්ලම් එක් කළ හැකි ය.
(5) අනුස්වාරයට පූර්වයෙන් යංශය භාවිත කළ හැකි ය. (......)

1.5. **රේඵය, රකාරාංශය, යංශය** හා **ගයනුකිත්ත** සහිත වචන **අනුපිළිවෙළින්** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ඖචිත්‍ය, මහෞෂධ, සවර්ණ, උපක්‍රම
(2) ප්‍රකෘති, ඓහලෞකික, සකර්මක, අමාත්‍යාංශය
(3) ගර්භය, සුප්‍රබුද්ධ, අව්‍යය, යෞවන
(4) සාමුද්‍රික, භූගර්භ, ගෞරවාර්හ, ශල්‍යාගාරය
(5) ප්‍රහර්ෂ, ඖද්භිජ, ඖත්සුක්‍යය, භෛතචිකිත්සක (......)

1.6. එකිනෙකට **අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති** වරණය තෝරන්න.
(1) මාර්ග නීති, මෞලි මංගල්‍යය, රණවිරු උපහාර, සමාජ ප්‍රශ්න
(2) වෛද්‍ය විද්‍යාලය, පෙර අඹර, ප්‍රවාහණ අංශය, මඟී ජනතාව
(3) පාසල් අධ්‍යාපනය, ලාංකික අනන්‍යතාව, සාහිත්‍ය මණ්ඩපය, සමූල ඝාතනය
(4) තෙමහල් මන්දිරය, වනවාසී නිකාය, මදුරු මර්දනය, මානව හිතවාදී
(5) මාතෘ උපහාර, ආචාර්ය මණ්ඩලය, ලක් දෙරණ, කිරිය අදියර (......)

1.7. **තත්සම වචන පමණක්** යෙදී ඇති වරණය කුමක් ද?
(1) පාලක, ඵල, පණ, ප්‍රදාන
(2) ආකල්ප, විකල්ප, සංකල්ප, කල්ප
(3) ප්‍රමාණ, විමන, ශ්‍රමණ, සමාන
(4) චන්දන, වන්දන, කැන්දන, වින්දන
(5) පරිසර, තිරසර, පරිවාර, සුකුමාර (......)

1.8. මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) සත්පුරුෂ - අසත්පුරුෂ, දුර්ජන, අසජ්ජන, අඥබාල
(2) උච්ච - පහත්, නීච, අධම, උසස්
(3) දැමුණු - අශාන්ත, නොදැමුණු, අසංවර, අදාන්ත
(4) දුර්ලභ - සුලභ, බහුල, අධික, බොහෝ
(5) විදග්ධ - අඥාන, මෝඩ, මූර්ඛ, අවිදග්ධ (......)

[දෙවැනි පිටුව බලන්න.

www.alpanthiya.lk

A/L පන්තිය
www.alpanthiya.lk

1.9. මුලින් දී ඇති පදයට **සමානාර්ථ පදයක්** ඇතුළත් **නො වන** වරණය තෝරන්න.
(1) ස්වර්ණ - රත්රන්, කනක, හේම, රුවන්
(2) කූටය - මුදුන, අග්‍රය, කුළ, මස්තකය
(3) කුරුල්ලා - විහඟ, පක්ෂියා, ද්විජ, දද
(4) මුහුද - ජලනිධි, සමුද්‍ර, අර්ණව, සිඳු
(5) ස්නේහ - පෙම්වත්, ආලවන්ත, ආදරණීය, ළෙන්ගතු (......)

1.10. **විශේෂණ පූර්ව පද, උපමාන පූර්ව පද, විශේෂණ අපර පද,** හා **උපමාන අපර පද** යන **විශේෂණ සමාස** පද **පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(1) පැරකුම්රජ, සුදුමල, සසරකතර, තිසරතන
(2) තිසරතන, සසරකතර, සුදුමල, පැරකුම්රජ
(3) සුදුමල, පැරකුම්රජ, තිසරතන, සසරකතර
(4) සුදුමල, තිසරතන, පැරකුම්රජ, සසරකතර
(5) සසරකතර, පැරකුම්රජ, තිසරතන, සුදුමල (......)

1.11. **කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත** වරණය තෝරන්න.
(1) මැරූ, ඇරූ, සෑරූ, වැරූ
(2) පිසින, ඉසින, නසින, බසින
(3) වැස්ස, මැස්ස, බැස්ස, කැස්ස
(4) පැවරීම, ඇතිරීම, මැතිරීම, වැතිරීම
(5) ඇල්ලූ, ඇල්ලූ, සෙල්ලූ, ඉල්ලූ (......)

1.12. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(අ) "**කාලා** රසමුසු බෝජන කර පෙම්"
(ආ) "**ගනිති** අය පඬුරු පෙර නියමින්"
(ඉ) "... ළෙල **දිදී** විදුලිය පබා"
(ඊ) "ඔවා **දෙනු** පරහට"
(1) පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, ත්‍රෛකාලිකක්‍රියා, විධික්‍රියා
(2) ත්‍රෛකාලිකක්‍රියා, මිශ්‍රක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා
(3) මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, ත්‍රෛකාලිකක්‍රියා, විධික්‍රියා
(4) පූර්වක්‍රියා, ත්‍රෛකාලිකක්‍රියා, මිශ්‍රක්‍රියා, විධික්‍රියා,
(5) විධික්‍රියා, ත්‍රෛකාලිකක්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා (......)

1.13. **උක්ත පද දෙකක්** හා **අනුක්ත පද දෙකක්** අන්තර්ගත වරණය තෝරන්න.
(1) බැතිමතෙක්, ඇතින්නක, මිත්තණියන්, තෝ
(2) තවුසකු, නිතිඥයකු, ගදඹෙක්, මඟීන්
(3) උගරෝ, මීයෝ, බමුණෝ, බිරියන්
(4) සතකු, තොප, සුරිහු, සිඟන්නන්
(5) සොරකු, කොරකු, බිහිරකු, අන්ධයෙක් (......)

1.14. **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) අවවාද, අවජාත, අවගුණ, අවමාන
(2) සම්භාෂණ, සන්තාප, සංවේදන, සම්මාන
(3) පිරිසිදු, පිරිපුන්, පිරිසිඳ, පිරිහුණු
(4) සුසර, සුමුදු, සුසිනිඳු, සුරතුරු
(5) දුර්ගුණ, දුහද, දුසිරිත්, දුෂ්කර (......)

1.15. "ආලයෙන් වෙලි **සැදී** මෙ **ලතාමණ්ඩපයෙන් වණ්ඩාතප** ඛණ්ඩිත වේ හිරුරජිඳුගෙ" යන උද්ධෘතයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන් ඇති පද** අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) සන්ධි, කෘදන්ත හා සමාස
(2) සමාස, කෘදන්ත හා සන්ධි
(3) කෘදන්ත, සන්ධි හා සමාස
(4) සන්ධි, සමාස හා කෘදන්ත
(5) කෘදන්ත, සමාස හා සන්ධි (......)

1.16. **ව්‍යාකරණානුකූල ව නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?
(1) දේවාලය, හිමාලය, ජාත්‍යාලය, විද්‍යාලය
(2) ලට්ට-ලොට්ට, වං-හුං, ලවක්-දෙවක්, තක්කු-මුක්කු
(3) නාවදොර, තුන්ලෝ, පස්පියුම්, දසදෙස
(4) ඖචිත්‍ය, කෞශල්‍ය, සෞඛ්‍ය, සෞන්දර්ය
(5) වැදිලි, විදිලි, බැදිලි, සිදිලි (......)

1.17. **සමාසයක් නො වන පදයක් ඇතුළත්** වරණය තෝරන්න.
(1) දිවිසයුර, සසරකතර, හදවිල, ජීවනකුසුම
(2) නිහඬ, නිමල, නිපුණ, නිවරද
(3) නිල්දිය, සුදුහුණු, රතුපලස, කළුපැල්ලම
(4) රජගෙදර, තාපසාරාමය, බලුකූඩුව, ළමාසමිතිය
(5) තුන්දොස්, තෙමඟුල, අටලෝදහම, පසිඳුරන් (......)

1.18. **එක ම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.
(1) කොළඟ, නුවනග, මුවග, ගිරග
(2) චූලෝදර, සහෝදර, පයෝධර, යශෝධර
(3) ගොක්කොළ, ලිබ්බොක්ක, අස්සන, කම්මල
(4) සම්මන්ත්‍රණ, සානුනාසික, සානුකම්පික, සමලංකෘත
(5) ඈවුරුදු, ඇඟිලි, ඇස, ඇගසවී (......)

1.19. ව්‍යාකරණානුකූල ව **නිවැරදි වැකිය** තෝරන්න.
(1) මේ පාසලෙහි ශිෂ්‍යයන් නැත.
(2) සියලු සිංහලයෝ බෞද්ධයෝ නො වෙති.
(3) මේ ගමෙහි දෙවි කෙනෙක් වැනි මිනිසෙක් වෙසෙයි.
(4) දරුවා ද මම ද මිනිස්සු ද ගමට යති.
(5) වලා පෙළ අහසේ පා වෙති. (......)

1.20. **වඩාත් ම නිවැරදි පද බෙදීම** සහිත වාක්‍යය තෝරන්න.
(1) ගුණවත්යැයි කියූ දරුවෝ දෙමාපියන් බැලීමටවත් නොපැමිණියහ.
(2) සුභාවිත ගීත කලාව වූ කලී රචනයේ ත් වාදනයේ ත් ගායනයේ ත් සුසංයෝග ය යි.
(3) විදුහල්පතිතුමාද විදුහල්පතිතුමියද දරුවන් ගේ අභිවෘද්ධි ය පිණිස වැඩ කරන්නා හ.
(4) ක්‍රීඩාභූමියේ දී දක්ෂතාව මෙන් ම සංයමය ද අතිශයින් වැදගත් ය.
(5) ගුණගරුකව ජීවත් වන්නෝ නිහඬ තාව අගය කරති. (......)

(ලකුණු 20 යි.)

[තුන්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | |
|---|---|
| සිංහල | II |
| சிங்களம் | II |
| Sinhala | II |

71 S II

## II කොටස

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සංස්කෘතික පරිසර විද්‍යාව නම් සංකල්පය පුරාවිද්‍යා ශික්ෂණයට පමණක් සීමා වූවක් නොවේ. එය දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව ආදී පුළුල් පරාසයක දිවෙන වෙනත් සමාජයීය හා මානව ශාස්ත්‍ර විෂයක්ෂේත්‍රයන් සමග ද බද්ධව පවතී. සංස්කෘතික පරිසර විද්‍යාවේ දී වඩාත් අවධානයට යොමු කෙරෙන්නේ අර්ථකථනාත්මක පුරාවිද්‍යාවේ ප්‍රධාන න්‍යායාත්මක සංකල්පයක් ලෙස සැලකෙන පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව නම් විෂයය පිළිබඳව ය. පොදුවේ ගත් කල සංස්කෘතික පරිසර විද්‍යාව නම් විෂයය සඳහා ක්‍රමික පදනම සැකසී ඇත්තේ දහඅටවන සියවසේ සිට පමණ ය. එතෙක් පැවති දේවනිර්මාණවාදී අදහස් බිඳ දමමින් චාර්ල්ස් ඩාවින්, තෝමස් හක්ලීස් ආදීන් ජීවවිද්‍යාත්මක පරිණාමයක් නැති නම් අනුවර්තීය යාන්ත්‍රණයක් පිළිබඳ ව දැක්වූ අදහස් ද කාල්මාක්ස්, ෆෙඩ්රික් එංගල්ස් වැන්නන් සමාජ පරිණාමය පිළිබඳ ව දැක්වූ අදහස් ද මේ සඳහා මූල බීජ සපයා ඇත. බටහිර චින්තනය තුළ ඇති වූ අනුවර්තීය දාර්ශනික පරිණාමය බොහෝ ශික්ෂණයන්හි ගමන් මාර්ගය තීරණාත්මක ලෙස වෙනස් කිරීමට සමත් විය. පරිණාමවාදය, ව්‍යුහවාදය, නූතනවාදය හා පශ්චාද්නූතනවාදය මෙහි ලා ප්‍රධාන ගාමක බලවේග වශයෙන් විශාල මෙහෙයක් ඉටු කරනු හඳුනාගත හැකි ය. මෙම සංකල්පවල බලපෑම පුරාවිද්‍යා ශික්ෂණය කෙරෙහි ද විවිධාකාර න්‍යායාත්මක එළැඹුම් ඔස්සේ සම්ප්‍රේෂණය වීම වර්ෂ 1960 පමණ සිට නව පුරාවිද්‍යාව නැතහොත් සංස්ලේෂී පුරාවිද්‍යාව නම් න්‍යායාත්මක සංකල්පයක් පුරාවිද්‍යා ශික්ෂණය තුළ වර්ධනය වීමෙන් පැහැදිලි වෙයි. ඉන් අනතුරුව විශේෂයෙන් පශ්චාද්නූතනවාදයේ ආභාසයෙන් පශ්චාත් සංස්ලේෂී පුරාවිද්‍යාව නම් සංකල්පයක් වර්ෂ 1970 පමණ සිට බටහිර රටවල බිහිවීමෙන් ද ඉහත සංකල්පවල බලපෑම තහවුරු වෙයි. මේ සියලු න්‍යායාත්මක සංකල්ප පුරාවිද්‍යාව තුළ පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාවේ දිශානතිය හා එහි භූමිකාවේ ස්වරූපය කෙරෙහි තීරණාත්මක බලපෑම් ඇති කළ ඒවා ය. පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව අවබෝධ කර ගැනීමට නම් මූලික වශයෙන් ම මිනිසා සහ පරිසරය අතර පැවති අන්‍යොන්‍ය සබඳතාවයේ ස්වරූපය හඳුනාගත යුතු ය. මානව ක්‍රියාකාරකම් පරිසරය මත පුළුල් පරාසයක් පුරා ව්‍යාප්ත වන ස්වරූපයේ වෙනස්කම් ඇති කිරීමට සමත් ය. පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව තත්ත්වාකාරයෙන් අවබෝධ කර ගැනීමට ඉවහල් වන තවත් වැදගත් න්‍යායාත්මක සංකල්ප දෙකක් ලෙස පරිණාමය හා අනුවර්තනය හැඳින්විය හැකි ය.

(i) සංස්කෘතික පරිසර විද්‍යාව බැඳී පවතින්නේ කවර විෂයයන් සමග ද?
(ii) අර්ථකථනාත්මක පුරාවිද්‍යාවෙහි ප්‍රධාන න්‍යායාත්මක සංකල්පය ලෙස සැලකෙන්නේ කුමක් ද?
(iii) බොහෝ ශික්ෂණයන්හි ගමන් මග තීරණාත්මක ලෙස වෙනස් කිරීමට බලපෑ ගාමක බලවේග මොනවා ද?
(iv) පශ්චාත් සංස්ලේෂී පුරාවිද්‍යාව බිහිවන්නේ කවර විෂයයක ආභාසයෙන් ද?
(v) පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව අවබෝධ කර ගැනීමට ඉවහල් වන්නේ කවර සංකල්ප ද?

(ලකුණු 10 යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

අධ්‍යාපනයෙහි ලා ඉතා වැදගත් මෙහෙයක් කෞතුකාගාරවලින් සිදු විය හැකි බව බොහෝ දෙනා පිළිගනිති. කෞතුකාගාර ප්‍රදර්ශන භාණ්ඩ, ඉගැන්වීමෙහි දී ඉතා ප්‍රයෝජනවත් උපකරණ වන අතර පන්තියෙහි දී උගන්වන විෂය කරුණු වඩාත් තහවුරු කිරීම සඳහා ගුරුවරුනට ඒවා භාවිත කළ හැකි ය. බොහෝ කෞතුකාගාර වැඩසටහන් විමසීමේ දී පාසල් ළමයින් සඳහා මේවායින් සිදු කළ හැකි සේවාව අප්‍රමාණ බව පැහැදිලි වේ. මේ වැඩසටහන්වල සාර්ථකභාවය සහ කාර්යසාඵල්‍යයට හේතු වන සාධක ගණනාවක් ඇති බව ද සැලකිය යුතු ය. බාල පරපුරෙහි අනාගතය රැඳී ඇත්තේ ගුරුවරුන් අත හෙයින් ඔවුන් විසින් සමාජයට ඉමහත් සේවයක් ඉටු කරනු ලැබිය යුතු ය යන්න වර්තමානයේ පිළිගත් මතය යි. තමන් භාරයේ සිටින දරුවන් තැන්පත්, හොඳ හැදීමෙන් යුත්, ප්‍රයෝජනවත් පුරවැසියන් බවට පත් කිරීමේ භාරදූර වගකීම ඔවුන් සතු ය. මෙම බරපතළ වගකීම පන්ති කාමරයෙහි ඉගැන්වීමෙන් පමණක් ඉටු කළ නොහැකි බැවින් පාසල් අධ්‍යාපන පටිපාටියට අතිරේක ව කෞතුකාගාරවලින් ගත හැකි ප්‍රයෝජන බෙහෙවින් අගය කෙරේ. නානා යුගවලට සහ දේශවලට අයත් වූ ද විවිධ අංශවලට අයත් වූ ද තථ්‍ය වූ සහ ඉතා විශ්වාස කටයුතු වූ ද වස්තු කෞතුකාගාරවල දක්නට ඇත. මේවායින් බොහෝ වස්තු එරටෙහි වෙනත් තැනක දී දකින්නට හෝ අධ්‍යයනය කරන්නට හෝ පාසල් ළමයින්ට හෝ ගුරුවරුන්ට හෝ හැකිවෙතොත් ඒ කලාතුරකිනි.

(ලකුණු 15 යි.)

[හතරවැනි පිටුව බලන්න.

www.alpanthiya.lk

A/L පන්තිය
www.alpanthiya.lk

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) සිංහල ගීතය පෝෂණයෙහි ලා ජන සාහිත්‍යයෙන් ලැබී ඇති ආභාසය
(ii) අදූරදර්ශී මානව ක්‍රියාකාරකම් හා ස්වාභාවික විපත්ති
(iii) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හා අනාගත අභියෝග
(iv) ලාංකේය ශ්‍රම බලකායට යාචක ප්‍රජාව සම්බන්ධ කර ගැනීමේ ක්‍රමෝපාය
(v) රටක සංවර්ධනය කෙරෙහි සමබර වූ විදේශ ප්‍රතිපත්තියක අවශ්‍යතාව
(vi) ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි පෞද්ගලික විශ්වවිද්‍යාලයවල බලපෑම (ලකුණු 25 යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල **සදෝෂ තැන් ඇතොත් නිදෝෂ කොට** ලියන්න.

(i) දරුවෝ එහි යතත් අපි එහි නො යමු.
(ii) අපි ජයගතිමු'යි දේශපාලකයන් උදම් ඇනූහ.
(iii) ඇත දියඹෙහි පිහිනන තල්මසුන් අපට පෙනෙති.
(iv) මවුපියෝ යහපත් වෙත් නම් දරුවෝ ද යහපත් වෙති.
(v) අම්මා ද අක්කා ද මම ද එහි ගියෙමි. (ලකුණු 05 යි.)

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

(i) ශිෂ්‍යයෝ මහාචාර්යතුමා පසසති.
(ii) දඩයක්කාරයෝ අභයභූමියට වැදී වනසතුන් දඩයම් කළහ.
(iii) නවකතාකරුවෝ විචාරකයන් පෙළා දකිති.
(iv) ව්‍යාපාරිකයෝ තම උත්සව සඳහා ගායකයන් ගෙන්වති.
(v) ඔවුහු අප මුළා කළහ. (ලකුණු 05 යි.)

(ඉ) **නිවැරදි වැකියක්** නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) දරු වියොවින් (ඔවුන්/ඔවුහු) හඬා වැලපෙති.
(ii) ස්තුති කථාවෙන් අනතුරුව (සභාව/සභාතොමෝ) විසිර ගියේ ය.
(iii) නාහිමියෝ (මිනිසුන්/මිනිස්සු) ලවා විහාර භූමිය පිළිසකර කරවති.
(iv) පියා විසින් (අප/අපි) රක්නා ලදුමු.
(v) (සොරුන්/සොරු) ආහ'යි ඔවුහු බිය වූහ. (ලකුණු 05 යි.)

**5.** (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.

(i) ඔවුන්ට **ප්‍රවේණියෙන්** හිමි වූ වස්තුව බොහෝ ය.
(ii) සිංහල ජනශ්‍රැතියට **පුරාවෘත්ත** ද අයත් වෙයි.
(iii) සිංහලයා බටහිර සිරිත්-විරිත් **අන්ධානුකරණය** එවක ගත්කරුවන්ගේ උපහාසයට ලක් විය. (ලකුණු 03 යි.)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

(i) මධ්‍ය කාලයට අයිති
(ii) වචනවල නිෂ්පත්තිය
(iii) කෙනකුගේ ඉරණම දැනගත් තැනැත්තා (ලකුණු 03 යි.)

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.

(i) පුද්ගල .............................. ගොඩනැඟීමට අධ්‍යාපනය ද ඉවහල් වෙයි.
(ii) යෞවන .............................. ඔප් නංවන බවට ඇමතිතුමා පොරොන්දු විය.
(iii) සෑම සංස්කෘතියකට ම .............................. අංග ද අත්‍යවශ්‍ය වේ.
(iv) පුද්ගලයා.................... බන්ධනයන් කෙරෙහි ගිජු වෙයි.
(v) ඒ ශිෂ්‍යයා.................... ඥානයෙන් යුක්ත ය.
(vi) පැරණි කවියා අලංකාර .................... කිරීමෙහි ලා දක්ෂ ය.

( ලෞකික, ව්‍යවහාරික, කුසලතා, පෞරුෂය, භෞතික, භාවිත) (ලකුණු 03 යි.)

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ පදය යොද වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.

(i) ඔහු තනතුරකට **පත්** වෙයි.
(ii) **සඳ** මත පා තැබීම කළ නොහැකි දෙයක් බව ඇතැමුන්ගේ විශ්වාසය යි.
(iii) අයදුම්පතක මුලින් ම ලිවිය යුත්තේ තම **නම** යි.
(iv) **පුර** පොහොය සෑම මසක් පාසා ම උදා වෙයි.
(v) වැද්දා වැවෙන් මාළු **බා** වනයට යයි.
(vi) **දන** රැස් කිරීම කවුරුත් ප්‍රිය කරති. (ලකුණු 06 යි.)

[පස්වැනි පිටුව බලන්න.

**6.** පහත දැක්වෙන වාක්‍යවල **තදකළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය** දක්වා ඇත. ඒවායෙහි **අනුඅංගය** දක්වන්න.

(i) කනතුරු පිටුපස **ලුහුබඳින** මිනිස්සු ඇතැම් විට **පාපතර** ක්‍රියාවල **ද** නිරත වෙති. (**බඳින** - කෘදන්ත, **පාපතර** - තද්ධිත, **ද** - නිපාත)

(ii) **බමුණාණෝ සූර්යෝදයට** පෙර **ගංගානදියෙහි** ජලස්නානය කළහ. (**බමුණාණෝ** - තද්ධිත, **සූර්යෝදය** - සන්ධි, **ගංගානදිය** - සමාස)

(iii) **සුනිල්** දියදහර මත සුපිපි **සුදුනෙළුම** පරිසරය **ප්‍රභාවත්** කළේ ය. (**සුනිල්** - උපසර්ග, **සුදුනෙළුම** - සමාස, **ප්‍රභාවත්** - තද්ධිත)

(iv) දරුවා **ගසින්** ගෙඩියක් කඩා, **පිහියෙන්** එය **කපමින්** මුවගට සිනා නැඟී ය. (**ගසින්** - විභක්ති, **පිහියෙන්** - විභක්ති, **කපමින්** - ක්‍රියා)

(v) **දෙසබසරැස** නගනු වස් මහමෙහෙයක් **කළ කුමරතුගුවෝ** හෙළහවුල ඇරඹූහ. (**දෙසබසරැස** - සමාස, **කළ** - කෘදන්ත, **කුමරතුගුවෝ** - විභක්ති)

(ලකුණු 15 යි.)

**7.** (අ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) කථාවේ ප්‍රමාණයට ක්‍රියාව නැත
(ii) කිසිම විදිහකින් නිදහසක් නැති වීම
(iii) උගතා කලබල නොවෙයි
(iv) ආපසු නොඑන පුද්ගලයා අලාභ කොට යෑම
(v) නොසිතූ අන්දමේ ප්‍රතිඵලයක් ලැබීම
(vi) පමණ දැන කටයුතු කිරීම

(ලකුණු 03 යි.)

(ආ) පහත දී ඇති **රූඪිවල අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

(i) හතර බීරි කථාව
(ii) තිකිණි සෙවීම
(iii) බක තපස් රැකීම
(iv) තෝන් ලණුව දා ගැනීම
(v) ඇගේ මාළු නටනවා
(vi) වහ කදුරු කැවීම

(ලකුණු 03 යි.)

(ඉ) පහත දී ඇති **එක් එක් යුගල පද සෑදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

(i) ආවාහ - විවාහ
(ii) අක්කා - නගෝ
(iii) මහත - දෙහෙත
(iv) දරු - මල්ලෝ
(v) නහින - දෙහින
(vi) පොඩි - පට්ටම්

(ලකුණු 03 යි.)

(ඊ) පහත දී ඇති **ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

(i) ගහමව්වා
(ii) ඔයනවා
(iii) හොයනවා
(iv) වැහි බිත්තර
(v) තැම්ම
(vi) මන්ඩාරම

(ලකුණු 03 යි.)

(උ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත්** ලියන්න.

(i) කමත අඹනවා
(ii) ඇඹයා
(iii) දිස්ටිය
(iv) අම්බුලි මාමා
(v) උද්දෙරි
(vi) කරවාඩය

(ලකුණු 03 යි.)

**8.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අභාප්‍රියයාණනිඔබමාදක්නටපැමිණියේසාරමසකටපසුවයිස්වාමිනිඔබනොමැතිවගෙවීගියශීතසෘතුවමටග්‍රීෂ්මයක්මවිය
දැන්වසන්තසෘතුවපැමිණඇතකෝකිලයෝකූජනයකරතිමයූරයෝකේකාධ්වනිපවත්වතිමුළුපරිසරයම
සශ්‍රීකත්වයෙන්බරවඇතමෙවරනම්මාඅතැරනොයනුමැනවපෙම්බරාණනිමාප්‍රේමියනිමටසමාවූවමැනවඅපගේ
පෞද්ගලිකසුඛවිහරණයටවඩාජාතියේආරක්ෂාවදේශයේඅභිමානයමෙන්මවංශපරම්පරාවේප්‍රෞඪත්වයප්‍රමුඛත්ව
යෙහිලාසැලකියයුතුයපරසතුරන්ගෙන්රටගලවාගැනීමේකාර්යයෙහිව්‍යාවෘතවසිටිනබැවින්සේනාසංවිධානය
ටමුල්තැනදීමටසිදුවියඒකෙසේවුවත්මාහෙටනැවතසටන්බිමටයායුතුයඑසේනම්ප්‍රියයදියනාමාමේසැකසූරළුභෝජනය
අනුභවකොටමල්පහන්ගෙනවහවහාඅපිඉසුරුමුනිවිහාරයටයමුමටඔබසමඟඑහිදීකළයුතුමන්ත්‍රණයක්ඇතස්වාමිනිඅපිවි
හාරයවැඳදියපොකුණඅබියසළද්‍යානයටයමුමාප්‍රියසුභදාණනිමානිවසෙහිදිවිගෙවනුයේහුදකලාවමයඔබගේනැදෑ
යෝද්මටනොයෙකුත්ඇනුම්පදකියතිවඳඑකියකැයිනිග්‍රහදකරතිඅනේමාප්‍රියයමටඔබවැනිම්වූපුත්‍රැවනකලබාදෙන්නැයිඈ
ඔහුගේඇකයේවාඩිවීපපුතුරටහිසතබාකනටසෙමින්මිමිණුවායප්‍රේමියමමඑයඉටුකරන්නෙමියිඔහුදඇයදැඩිවතමළයටසම්ප
කරගත්තේය

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.
(ii) **කාර්යය, ප්‍රාර්ථනා** යන වචන රේඵය යොදා නැවත ලියන්න.
(iii) **'පුද්ගල + ඉක - පෞද්ගලික** නම් **භූත + ඉක'** කෙසේ සකස් වේ ද?
(iv) **'ප්‍රෞඪ'** යන්නෙහි ස්වර හා ව්‍යඤ්ජන වෙන් කර ලියන්න.
(v) **'කණ්ඨජ, අඝෝෂ, මහාප්‍රාණයක්'** සහිත වචනයක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(ලකුණු 15 යි.)

* * *

www.alpanthiya.lk